# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
## அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Public Services, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | CS/SLAS/ANN.TRA/2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2022.02.10 |

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම් / දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**2022 - වාර්ෂික ස්ථාන මාරුවීම්**
**(ශ්‍රී ලංකා පරිපාලන සේවය - I,II,III ශ්‍රේණි)**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නිලධරයින්ගේ වාර්ෂික ස්ථාන මාරු**

2022 වර්ෂය සඳහා සිදු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන්, මගේ සමාංක හා 2022.01.10 දිනැතිව නිකුත් කළ ලිපිය හා බැඳේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරු වන නිලධරයින්ගේ වාර්ෂික ස්ථාන මාරු, 2022 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වන දිනය වන 2022.03.02 දින සිට ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති බව, එහි ලේකම්ගේ අංක : PSC/APL/1/AT/2021 හා 2022.02.07 දිනැති ලිපියෙන් දන්වා ඇත.

03. ඒ අනුව, මේ පිළිබඳව අදාළ සියලු නිලධරයින් දැනුම්වත් කර, 2022 වාර්ෂික ස්ථාන මාරුවීම් 2022.03.02 දින සිට ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

04. එමෙන්ම, වාර්ෂික ස්ථාන මාරු චක්‍ර අංක 034, 035, 037, හා 059 යටතේ ස්ථාන මාරු ලබා ඇති නිලධරයින්ගේ ස්ථාන මාරු මගේ සමාංක හා 2021.11.22 දිනැති ලිපිය මඟින් දන්වා තිබූ දිනවල සිට ද, වාර්ෂික ස්ථාන මාරු චක්‍ර අංක 039 යටතේ ස්ථාන මාරු ලබා ඇති නිලධරයන්ගේ ස්ථාන මාරු මගේ සමාංක හා 2022.01.10 දිනැති ලිපියෙන් දැනුම් දී ඇති දින සිට ද ක්‍රියාත්මක විය යුතු බවට ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දුරකතන<br>தொலைபேசி<br>Telephone | 011-2696211-13<br>011-2166000 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2695279 | ඊ-මේල්<br>மின்னஞ்சல்<br>E-mail | info@pubad.gov.lk | වෙබ් අඩවිය<br>வெப்தளம்<br>Website | www.pubad.gov.lk |